# WEATHER FORECAST FOR 21st NOVEMBER 2018

## (Issued at 1200 noon on 20th November 2018)

**The low pressure area in the Central part of South Bay of Bengal Sea area is very likely to intensify further into a depression during next 24 hours and move westwards. Due to the effect of above system rainy condition is expected to enhance over the island.**

Showers or thundershowers will occur at times over most parts of the island.

Heavy falls about 100-150mm can be expected at some places in the Northern Province. Heavy falls about 100mm can be expected at some places, particularly in the Western, Central and Sabaragamuwa provinces and in the Galle, Mathara and Puttalam districts.

Fairly strong gusty winds about 40-50kmph can be expected over Northern province during today(20) and tomorrow

Misty conditions may occur at some places in the Central, Sabaragamuwa and Western provinces during the morning.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දකුණු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ මධ්‍යම කොටසෙහි පවතින අඩු පීඩන කලාපය ඉදිරි පැය 24 තුලදී තවදුරටත් පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙමින් ඉදිරි පැය 24 තුලදී බස්නාහිර දෙසට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ. මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් දිවයින පුරා වැසි තත්ත්වයේ වැඩිවීමක් බලාපොරොත්තුවේ.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

උතුරු පළාතේ ඇතැම් ස්ථානවලට මි.මී. 100-150 පමණ තද වැසි ද ඇති විය හැක අතර විශේෂයෙන්, බස්නාහිර, මධ්‍යම සහ සබරගමුව පළාත්වලත් ගාල්ල, මාතර සහ පුත්තලම දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි. මී. 100 ක පමණ තද වැසි ඇති විය හැක.

උතුරු පළාත හරහා හමන පැ.කි.මී. 40-50 ක පමණ වන තරමක තද සුළං අද(20) සහ හෙට දින වලදී බලාපොරොත්තු විය හැක.

මධ්‍යම, සබරගමුව සහ බස්නාහිර පළාත්වල සමහර ප්‍රදේශවල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් ඇති විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

# WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 20th November 2018)

**The low pressure area in the Central part of South Bay of Bengal Sea area is very likely to intensify further into a depression during next 24 hours and move westwards. Due to the effect of above system rainy condition is expected to enhance over the Northern sea area.**

**The fishermen area advised not to venture into sea areas off the coast extending from Mullaitivu to Mannar via Kankasanturai on 20th and 21st November 2018**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Trincomalee to Mathara via Kankasanturai, Puttalam and Galle. Heavy showers or thundershowers can be expected at some places in the sea areas off the coast extending from Mullaitivu to Mannar via Kankasanturai.

Showers or thundershowers may occur in the other sea areas around the island in the evening or night.

Winds will be South-westerly to Westerly and wind speed will be 30-40 kmph in the sea area extending from Trincomalee to Mathara via Kankasanturai, Puttalam and Galle.

Winds will be South-easterly in direction over other sea areas around the island and wind speed will be 25-35 kmph.

**The sea area extending from Mullaitivu to Mannar via Kankasanturai can be rough at times as the wind speed can increase up to 50-60 kmph at times.**

**Temporarily strong gusty winds( about 70-80kmph) and rough seas can be expected during thundershowers**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/11/20
Time : 1300 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය.
## 2018 නොවැම්බර් මස 20 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.

දකුණු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ මධ්‍යම කොටසෙහි පවතින අඩු පීඩන කලාපය ඉදිරි පැය 24 තුලදී තවදුරටත් පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙමින් බස්නාහිර දෙසට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තුවේ. මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් උතුරු මුහුදු ප්‍රදේශයේ වැසි තත්ත්වයේ වැඩිවීමක් බලාපොරොත්තුවේ.

මුලතිවු සිට කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ වල 2018 නොවැම්බර් මස 20 සහ 21 යන දිනයන් හිදී ධිවර කටයුතු වලින් වැලකී සිටින ලෙස ධිවර ප්‍රජාවට අවධාරණය කර සිටී.

ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය, පුත්තලම සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. මුලතිවු සිට කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ වල සමහර ස්ථාන වලට තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රි කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය, පුත්තලම සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත සිට බස්නාහිර දක්වා වන දිශා වලින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ. සෙසු මුහුදු ප්‍රදේශවල සුළං ගිනිකොන දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 25-35 පමණ වේ.

මුලතිවු සිට කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50-60 දක්වා වැඩි වන අතර එවිට එම මුහුදු ප්‍රදේශ රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං(පැ.කි.මී 70-80 පමණ) ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)